# 10 ශ්‍රේණිය

# ඉතිහාසය

## 01. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය

සැකසුම

කේ.වී. මහේෂ් චින්තක චන්ද්‍රසිරි

මලල්පොළ මහා විද්‍යාලය

**නිපුණතාව :**

ඉතිහාසය ගොඩනැඟීමට උපකාරී වන මූලාශ්‍රය අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කරගනී.

**නිපුණතා මට්ටම :**

1.1 මූලාශ්‍රය පදනනම් කර ගනිමින් ඉතිහාසය ගොඩනැගෙන ආකාරය පැහැදිලි කරයි.

1.2 ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඵල :**

- මූලාශ්‍රය හඳුනා ගනියි.
- මූලාශ්‍රය වර්ග කරයි.
- මූලාශ්‍රය ඇසුරින් ඉතිහාසය විස්තර කරයි.
- ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පහදයි.
- ජීවිතය සාර්ථක කරගැනීමට ඉතිහාසයෙන් ලබාගතහැකි ආදර්ශ පෙන්වා දෙයි.

# 01. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය

## මූලාශ්‍ර වර්ගීකරණය

ඉතිහාසය යනු අතීත මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳ හදාරන විෂයකි. අප නොදන්නා කාලයක ජීවත් වූ එම මිනිසුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් හැදෑරීමේදී ඒ සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙන සියලු ක්‍රම **මූලාශ්‍ර** යනුවෙන් හැඳින්විය හැකිය. එවැනි මූලාශ්‍ර විශාල ප්‍රමාණයක් පවතින නමුත් නිවැරදිව ඉතිහාසය හැදෑරීමට නම් ඒවා නිසි වර්ගීකරණයකට ලක්කර භාවිත කළ යුතුය.

- මූලාශ්‍ර
  - සාහිත්‍ය මූලාශ්‍ර
    - දේශීය සාහිත්‍ය මූලාශ්‍ර
    - විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර
  - පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
    - අභිලේඛන
    - කාසි (නාණක මූලාශ්‍ර)
    - නටඹුන්
    - චිත්‍ර, මූර්ති හා පුරාවස්තු

## 1. සාහිත්‍ය මූලාශ්‍ර.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදා ගත හැකි සාහිත්‍ය මූලාශ්‍ර ප්‍රධාන කොටස් දෙකකි.

- සාහිත්‍යමය මූලාශ්‍ර
  - දේශීය සාහිත්‍යමය මූලාශ්‍ර
  - විදේශීය සාහිත්‍යමය මූලාශ්‍ර

**දේශීය සාහිත්‍ය මූලාශ්‍ර යනු :** අදින් වසර දෙදහසකට පමණ පෙර සිට ලාංකිකයින් විසින් ගද්‍ය හා පද්‍ය වශයෙන් වරින් වර ලියන ලද කෘතීන්ය.

**විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර යනු :** ලංකාවේ නොවන වෙනත් රටවල පුද්ගලයින් ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් රචනා කර ඇති තොරතුරු.

## දේශීය සාහිත්‍යමය මූලාශ්‍රය

ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා දේශීය සාහිත්‍ය මූලාශ්‍ර විශාල ප්‍රමාණයක් පවතින අතර එයින් එක් ප්‍රධාන මූලාශ්‍රයක් වන්නේ දීපවංශයයි.

## දීපවංසය

- දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම කෘතිය වන්නේ දීපවංසයයි.
- එය ක්‍රි.ව. හතරවන සියවසේදී පමණ රචනා කරන්නට ඇතැයි අනුමාන කරයි.
- මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් මෙරට ඓතිහාසික තොරතුරු හා ශාසනික ඉතිහාසයට සම්බන්ධ තොරතුරු එහි ඇතුළත් වේ.
- මූලාශ්‍රයක් ලෙස දීපවංසයේ පවතින දුර්වලතාවයන් වන්නේ, ඇතැම් ඓතිහාසික පුවත් කෙටියෙන් දැක්වීම හා පුනරුක්ති දෝෂ දක්නට ලැබීමයි.

පුනරුක්ති දෝෂ යනු එකම තොරතුර යළි යළිත් සඳහන් කිරීමය.

## මහාවංශය

- කතුවරයා : අනුරාධපුර දික්සඳ සෙනෙවියා පිරිවෙනේ වැඩ සිටි මහානාම නම් භික්ෂූන් වහන්සේ.
- රචනා වූ කාලය : ක්‍රිස්තු වර්ෂ පස්වන හෝ හයවන සියවසේදී පමණ රචනා කරන්නට ඇතැයි අනුමාන කරයි.
- තොරතුරු අන්තර්ගත වන කාල සීමාව : බුදුන් වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමය අවසානය වන තෙක්.
- රචනා කිරීමේදී තොරතුරු ලබාගත් මූලාශ්‍ර : ඊට පෙර රචනා වී තිබූ සීහලට්ඨකථා මහාවංශය, උත්තර විහාරට්ඨ කථා, විනයට්ඨ කථා ආදී මූලාශ්‍රයන්ගෙන් මේ සඳහා තොරතුරු ලබා ගන්නට ඇත.
- මහාවංසයේ ඇතැම් කරුණු සවිස්තරාත්මකව දැක්වීම සඳහා රචිත කෘතියේ නම : මහාවංශ ටීකාව හෙවත් වංසත්ථප්පකාසිනිය.

මහාවංශයේ විශේෂත්වය වන්නේ එහි මෙරට අඛණ්ඩ ඉතිහාසයක් ඇතුළත්ව තිබීමයි. කොටස් කිහිපයකින් යුතු එහි මුල් කොටස මහානාම හිමියන් විසින් රචනා කළ අතර ඉන් පසුව වෙනත් කතුවරු විසින් එහි ඉතිරි කොටස් රචනා කර තිබේ.

අනුරාධපුර යුගයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා කාලපරිච්ඡේදය තුළ විවිධ ග්‍රන්ථ රචනා වී ඇත. ඒ අතරින්,

- බෝධිවංසය, ථූපවංසය, ධාතුවංසය, පූජාවලිය, සද්ධර්මාලංකාරය වැනි ධර්ම ග්‍රන්ථ රජරට සමයේ ඉතිහාසය හැදෑරීමටත්,

- මෙරට ශාසන ඉතිහාසය පිළිබඳ ලියවී ඇති නිකාය සංග්‍රහය හා දේශපාලන තොරතුරු ඇතුළත් රාජාවලිය ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය කාලය දක්වා ඉතිහාසය හැදෑරීමටත්,

- සන්දේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය හා හටන් කාව්‍ය ආදී කෘති කෝට්ටේ රාජ්‍ය කාලයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමටත්,
  උපකාර වේ.

ලංකාවේ පවතින දේශීය සාහිත්‍ය මූලාශ්‍රයන් විවිධ කාල වකවානුවලදී විවිධ හේතූන් මත රචනා වී ඇති අතර අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා රචනා වූ බොහෝ කෘති ආගමික අරමුණුවලින් රචනා වූ ඒවා විය. එසේම අදාල සිදුවීම්වලින් සියවස් කිහිපයකට පසුව මේවා රචනා වීම ද සිදුවී ඇත. මේ නිසා ඉතිහාසය හැදෑරීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි. ඒ,

01. මූලාශ්‍රය රචනා වූ කාලය.

02. මූලාශ්‍රයේ කතුවරයා.

03. කතුවරයාගේ අරමුණු.

04. මූලාශ්‍රයට කරුණු සපයා ගත් ආකාරය.

යන ඒවා ය.

## විදේශීය සාහිත්‍යමය මූලාශ්‍ර

ශ්‍රී ලංකාව ප්‍රධාන මුහුදු මාර්ගයක් ආසන්නයේ පිහිටි බැවින් අතීතයේ සිටම විදේශිකයින් ලංකාව සමඟ සමීප සබඳතා පවත්වා තිබේ. ඒ අතරින් විදේශීය වෙළෙන්දන්, නාවිකයින්, දූතයින්, සංචාරකයින්, තානාපතිවරුන්, දේශ ගවේෂකයින් වැනි අය ලංකා ඉතිහාසය පිළිබඳව වැඩි තොරතුරු ප්‍රමාණයක් වාර්තා කර ඇත. මේ නිසාම විදේශීය මූලාශ්‍රවල වැඩි වශයෙන් ඇතුළත් වන්නේ, මෙරට පිහිටීමට අදාළ තොරතුරු හා මෙරට ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරුය. ඔවුන් ලංකාව සම්බන්ධයෙන් වාර්තාකර ඇති තොරතුරු ලබා ගන්නා ලද්දේ,

ලංකාවට පැමිණ දැකබලා ගැනීමෙන්

ලංකාව පිළිබඳව දන්නා අයෙකුගෙන් අසා දැනගැනීමෙන්

ලංකාව පිළිබඳ රචනා වූ පොත්පත් පරිශීලනය කිරීමෙන්

යන ක්‍රමවලටය.

ලංකාවට දුර බැහැර රටවල ලේඛකයින් පමණක් නොව අසල්වැසි ඉන්දියාවේ ඇතැම් මූලාශ්‍රවලද ලංකා ඉතිහාසයට අදාළ තොරතුරු ඇතුළත් වේ. ඒ අතරින් දකුණු ඉන්දියාවේ රචිත සීලප්පාදිකාරම්, මණිමේකලෛයි, පදිර්රුපත්තු වැනි ද්‍රවිඩ ග්‍රන්ථ වඩාත් වැදගත් වේ.


**තමන් විසින් නුදුටු එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ කතුවරුන් හා ඔවුන්ගේ කෘති**

**ග්‍රීක මූලාශ්‍රය** ඇරිස්ටෝටල්ගේ ඩිමුන්ඩෝ, මෙගස්තීනිස්ගේ ඉන්ඩිකා, ඔනෙසික්‍රිටස්ගේ වාර්තා

**රෝම මූලාශ්‍රය** ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා, ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය,

**චීන මූලාශ්‍රය** හියුං සියැං භික්ෂුවගේ දේශාටන වාර්තාව

**පෘතුගීසි මූලාශ්‍රය** ෆර්නාඕ ක්වේරෝස් පියතුමාගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය



**ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැකබලා ඒ පිළිබඳව තබන ලද වාර්තා හා ඒවායේ කතුවරුන්**

**චීන මූලාශ්‍රය** පාහියන් හිමිගේ දේශාටන වාර්තාව (බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය)

**අරාබි මූලාශ්‍රය** ඉබන් බතුතාගේ දේශාටන වාර්තාව

**පෘතුගීසි ජාතික** රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය (රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය)

**ඕලන්ද ජාතික** පිලිප්පස් බැල්ඩියස්ගේ කෘතිය (බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය)

**ඉංග්‍රීසි මූලාශ්‍රය** රොබට් නොක්ස්ගේ කෘතිය (එදා හෙළදිව)

## සාහිත්‍ය මූලාශ්‍රවල ප්‍රයෝජන

01. ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස් කර ගැනීමට.


02. එක් එක් අවධිවල දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට.

03. එක් මූලාශ්‍රයක් මගින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මගින් සනාථ කර ගැනීමට.

04. රටක විදේශීය සබඳතා අධ්‍යනය කිරීමට.

ඇගයීම අංක 1

**පෙළපොත ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

02. මෙම ලේඛන සකස් කිරීමට යොදාගනු ලබන්නේ මොනවාද?

03. මෙම ලේඛන රචනා කිරීමට යොදා ගත් උපකරණය නම් කරන්න.

04. මෙවැනි ලේඛනවල ලියවී ඇත්තේ මොනවාද?



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන්ද?

02. ඔහු කුමන ජාතිකයෙක්ද?

03. ඔහු ජීවත් වූයේ කුමන නගරයේද?

04. මොහු විසින් සිදුකළ ලංකාව හා සම්බන්ධ සුවිශේෂී කාර්ය කුමක්ද?

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමට පවතින පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
2. දීපවංශයේ දක්නට ලැබෙන දුර්වලතාවයන් මොනවා ද?
3. දීපවංශයේ අඩුපාඩු මගහරිමින් රචනා කළ කෘතිය කුමක් ද?
4. එය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
5. එහි තොරතුරු ඇතුළත් වන්නේ කුමන කාලයකට අදාළව ද?
6. මහාවංශ ටීකාව ලෙස හඳුන්වන්නේ කුමන මූලාශ්‍රය ද?
7. ලංකා ඉතිහාසය හැදෑරීමට උපකාරීවන වෙනත් වංශකතාවන් මොනවා ද?
8. ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු මොනවා ද?
9. විදේශීය ලේඛකයින් ලංකා ඉතිහාසය ලියා තැබීමේ දී ඒ සඳහා තොරතුරු ලබා ගත් ක්‍රම මොනවා ද?
10. ලංකා ඉතිහාසය හැදෑරීමට උපකාරවන දකුණු ඉන්දියාවේ රචිත ද්‍රවිඩ ග්‍රන්ථ මොනවා ද?
11. ලංකාවේ සංචාරය කරමින් ග්‍රන්ථයක් රචනා කළ චීන ජාතික සංචාරක භික්ෂූන් වහන්සේ කවුරුන්ද?
12. පළමු වරට ලංකා සිතියමක් නිර්මාණය කරන්නට ඇතැයි සැළකෙන්නේ කවුරුන් විසින්ද?

**පහත ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරන්න.**

01. මහා වංසය රචනා කිරීමේදී ඒ සඳහා අභාසය ලබාගන්නට ඇතැයි නොසැළකෙන මූලාශ්‍රය කුමක්ද?
   1. උත්තර විහාරට්ඨ කථා
   2. විනයට්ඨ කථා
   3. සීහලට්ඨකථා මහාවංසය
   4. වංසත්තප්පකාසිනිය

02. ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කළ ග්‍රීක ජාතික ලේඛකයාගේ නම සඳහන් පිළිතුර තෝරන්න.
   1. ටොලමි
   2. ඇරිස්ටෝටල්
   3. ප්ලීනි
   4. හියුංත් සියැං

03. ඉන්ඩිකා නම් කෘතියේ කතුවරයා කවුරුන්ද?
   1. ක්වේරෝස්
   2. ඔනෙසික්‍රිටස්
   3. මෙගස්තීනිස්
   4. පාහියන්

04. ඉතිහාසය හැදෑරීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ මින් කුමක්ද?
   1. මූලාශ්‍රය රචනා වූ කාලය
   2. මූලාශ්‍රයේ කතුවරයා
   3. මූලාශ්‍රය රචනා කරන සමයේ සිටි පාලකයා
   4. මූලාශ්‍රයට කරුණු සපයා ගත් ආකාරය

05. ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා හැදෑරීමේදී දේශපාලනික තොරතුරු ඇතුළත් කෘතියක් ලෙස වැදගත්වන ග්‍රන්ථය කුමක්ද?
   1. රාජාවලිය
   2. නිකාය සංග්‍රහය
   3. මහාවංසය
   4. පූජාවලිය

06. ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා පවතින ප්‍රශස්ති කාව්‍යක් සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි කෘතිය කුමක්ද?
   1. සීතාවක හටන
   2. පැරකුම්බා සිරිත
   3. ඉංග්‍රීසි හටන
   4. මයුර සංදේශය

## 2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර බෙදා දක්වන ප්‍රධාන කොටස් 4කි

පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
- අභිලේඛන
- කාසි (නාණක මූලාශ්‍ර)
- නටඹුන්
- චිත්‍ර, මූර්ති හා පුරාවස්තු

### අභිලේඛන

අභිලේඛන යනු : ගල් (ශිලා), මැටි පුවරු, බිත්ති, තඹ තහඩු, රන් තහඩු, දැව හා විවිධ භාජන ආදියේ ලියා ඇති පැරණි ලේඛනය. ඒ අතරින් ගල් මත ලියා ඇති ලිපි සෙල්ලිපි හෙවත් ශිලා ලේඛන ලෙස හඳුන්වයි.

# සෙල්ලිපි

සෙල්ලිපි පිහිටා ඇති ස්වරූපය අනුව කොටස් කිහිපයකි



ලෙන් ලිපි : ගල් ලෙන්වල හෝ කටාරම් අසල ලියූ ලිපි

ගිරිලිපි : ගල් තලාවක හෝ ගල් කුළුමත ලියූ ලිපි





ටැම්ලිපි : සකස්කළ ගල් කුලුණු මත ලියූ ලිපි



පුවරු ලිපි : සකස් කළ ගල් පුවරු මත ලියූ ලිපි



ආසන ලිපි : මල් ආසන මෙන් තැබූ ගල් පුවරු මත ලියූ ලිපි

- මෙරට පැරණිතම ශිලා ලේඛන බ්‍රාහ්මී ලිපි ලෙස හඳුන්වයි.
- එම ලිපිවල ප්‍රධාන වශයෙන්ම භික්ෂූන්ට ලෙන් පිදීම වැනි දේ වාර්තා කර ඇත.
- පැරණි සමාජ ඉතිහාසය හා ජනාවාස ව්‍යාප්තිය තේරුම් ගැනීමට මෙම ලිපි වැදගත් වේ.
- ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ශිලා ලේඛන ලිවීම අඛණ්ඩව සිදුවිය.

➢ ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසින් පසු ශිලාලේඛනවල වාර්තා කළ ප්‍රධාන කරුණු වන්නේ,

- විහාරාරාමවලට ගම් බිම් පිදීම.
- විහාරාරාම පාලනය
- රජයේ නීති මහජනයාට දැනුම් දීම
- බදු අය කිරීම
- වෙළඳාම
- වැරදිකරුවන්ට සමාව දීම
- පුද්ගලයන්ගේ සේවය ඇගයීම

  ආදියයි.

## කාසි (නාණක මූලාශ්‍ර)

✓ කාසි පිළිබඳ හදාරන විද්‍යාව නාණක විද්‍යාව නම් වේ.
✓ මෙරටින් හමුවන පැරණිතම කාසි හඳුන්වනු ලබන්නේ කහාපණ යනුවෙනි.
✓ ඒ සඳහා පුරාණ හෝ ධරණ යන නම ද භාවිත කරයි.
✓ මෙරට තුළ භාවිත කළ වෙනත් කාසි වර්ගයන් ලෙස ඇතා හා ස්වස්තික කාසි, ලක්ෂ්මී කාසි හා අක නම් රන් කාසි පෙන්වා දිය හැකිය.
✓ ලංකාවට අවශ්‍ය කාසි මෙරට තුළම නිපද වූ අතර ඒ සඳහා භාවිත කළ කාසි අච්චු පවා හමුවී ඇත.
✓ රෝම කාසි, චීන කාසි, ඉන්දියානු කාසි ආදී විදේශීය කාසි වර්ග ද මෙරට තුළ භාවිත කර තිබේ.

- රටේ ආර්ථික තත්ත්වය
- වෙළඳාම
- ලෝහ භාවිතය
- විදේශ සම්බන්ධතා

  ආදිය කාසි ඇසුරින් හඳුනාගත හැකිය.

## පුරාණ නටඹුන්


❖ ලංකාවේ බොහෝ ප්‍රදේශවල පැරණි ගොඩනැගිලි, දාගැබ්, ගල් කණු, වැව්, පොකුණු ආදී නටඹුන් දක්නට ලැබේ.
❖ නටඹුන් ඓතිහාසික ස්ථාන හෝ පුරාවිද්‍යාත්මක ස්මාරක ලෙස ද හඳුන්වයි.
❖ එවැනි නටඹුන් ආශ්‍රයෙන් විවිධ තොරතුරු හඳුනාගත හැකිය.

- පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව
- තාක්ෂණය
- ගොඩනැගිලි නිර්මාණය
- ශිල්පීය දක්ෂතා
- පරිසර සංරක්ෂණය හැකියාව
- ජල පාලනය

## චිත්‍ර, මූර්ති හා පුරාවස්තු

- පැරණි ජනතාව විසින් නිර්මාණය කරන ලද හෝ පරිහරණය කරන ලද හෝ දැනට ඉතිරිව ඇති දේ පුරාවස්තු ලෙස හැඳින්වේ.
- කෞතුකාගාරවල, ආගමික ස්ථානවල, විවිධ ආයතනවල හෝ පුද්ගලයින් භාරයේ පුරාවස්තු පවතී.
- ඒ ඇසුරින් හඳුනාගත හැකි තොරතුරු.
  - අතීත ජනතාවගේ ඇඳුම් පැළඳුම් හා ආභරණ භාවිතය
  - කොණ්ඩ මෝස්තර හා රූපලාවන්‍ය කටයුතු
  - කලා කුසලතා
  - වර්ණ භාවිතය
  - ආගමික විශ්වාස
  - පැරණි සංස්කෘතිය
  - තාක්ෂණය
  - විදේශ සබඳතා
  - ජීවන ක්‍රමය

## සීගිරි චිත්‍ර ඇසුරින් හඳුනාගත හැකි තොරතුරු කිහිපයක්



## ඇගයීම අංක 2

### පෙළපොත ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
02. මෙම ලිපිය කරවූ පාලකයා නම් කරන්න.
03. මෙම ලිපිය පිහිටා ඇති ස්වරූපය අනුව අයත් වන්නේ කුමන වර්ගයටද?
04. ලංකා ඉතිහාසය හැදෑරීමට වැදගත් වන වෙනත් සෙල් ලිපියක් නම් කරන්න.



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
02. මෙය නිෂ්පාදනය කර ඇත්තේ කුමන ලෝහයෙන්ද?
03. මෙවැනි කාසි ඇසුරින් ලබා දෙන ඓතිහාසික තොරතුරක් නම් කරන්න.
04. පැරණි යුගයේදී භාවිත කළ වෙනත් දේශීය කාසි වර්ගයක් නම් කරන්න.



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
02. මෙම කැටයම දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයේදීද?
03. මෙයින් නිරූපනය වන බවට සළකන්නේ කවුරුන්ද?
04. මෙම ස්ථානය ආශ්‍රිතව හඳුනාගත හැකි වෙනත් ප්‍රකට කැටයමක් නම් කරන්න.



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
02. එය කරවන ලද්දේ කුමන රජු විසින්ද?
03. එම ලිපිය මඟින් ප්‍රදානයක් කර ඇත්තේ කා හටද?
04. මෙම ලිපිය අයත්වන රාජධානි යුගය කුමක්ද?

### පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. අභිලේඛන රචනා කිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය මොනවා ද?
02. සෙල්ලිපි ලියා ඇති ස්වරූපය අනුව බෙදා දක්වන කොටස් මොනවා ද?
03. මෙරට පැරණිම ශිලා ලිපි හඳුන්වන්නේ කුමන නමින් ද?
04. ශිලා ලිපි ඇසුරින් හඳුනාගත හැකි තොරතුරු මොනවා ද?
05. ගල්පොත නම් ශිලා ලිපිය කරවන ලද පාලකයා නම් කරන්න.
06. ඔබ දන්නා ලංකා ඉතිහාසය හැදෑරීමට උපකාරීවන වැදගත් අභිලේඛන කිහිපයක් නම් කරන්න.
07. පනාකඩුව තඹ සන්නස කරවන ලද්දේ කවුරුන් විසින් ද?
08. පැරණි යුගයේ දී මෙරට භාවිතා කළ මුදල් වර්ග කිහිපයක් නම් කරන්න.

**පහත ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරන්න.**

01. සීගිරි කුරුටු ගී රචනා කිරීමට යොදා ගෙන ඇති මාධ්‍ය කුමක්ද?
 1. ශිලා (ගල්) 2. බිත්ති 3. තඹ තහඩු 4. දැව

02. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
 1. අඛණ්ඩ ඉතිහාස අධ්‍යනයට උපකාර වන්නේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ය.
 2. වංසකතා ප්‍රධාන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විශේෂයකි.
 3. ලංකාවේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් සොයා ගැනීම ඉතා අසීරුය.
 4. සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මඟින් සනාථ වේ නම් ඒවා වඩාත් විශ්වසනීය වේ.

03. මෙරටින් හමුවන පැරණිතම කාසි විශේෂය ලෙස සලකනු ලබන්නේ,
 1. කහාපණ 2. ස්වස්තික කාසි 3. ලක්ෂ්මී කාසි 4. අක නම් රන් කාසි

04. චිත්‍ර, මූර්ති හා පුරාවස්තු ආශ්‍රයෙන් හඳුනාගත හැකි තොරතුරු අතරට අයත් නොවන්නේ,
 1. පැරණි ජනතාවගේ ආභරණ භාවිතය.
 2. ජනතාවගේ විවිධ හැකියාවන් හා කුසලතා.
 3. ලංකාවේ අඛණ්ඩ රාජ නාමාවලිය.
 4. පැරණි ජනතාවගේ ජීවන ක්‍රමය.

## ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන

- තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය ලැබීමට.
- අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීමට.
- රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීමට.
- මනුෂ්‍යත්වයට ආදරය කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගීමට.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීමට.
- විවිධ මත ඉවසීමට හුරු වීමට.
- විචාර බුද්ධිය දියුණු වීමට.
- පෞරුෂත්වය වර්ධනය වීමට.

## පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීම

අතීතයේදී නිර්මාණය කළ දේ අතරින් දැනට ඉතිරිව ඇත්තේ කල් පවතින අමුද්‍රව්‍යවලින් කළ නිර්මාණයන් හෝ වැව් අමුණු වැනි මහා පරිමාණ නිර්මාණයන් පමණි. එහෙත් රට තුළ සිදුවන ශීඝ්‍ර ජනාවාස ව්‍යාප්තිය, මංමාවත් තැනවීම, ගොඩනැගිලි ඉදිකිරීම, කෘෂිකාර්මික කටයුතු ආදිය නිසා මෙවැනි වටිනා මූලාශ්‍ර විනාශ වන අවස්ථාද වේ. ඇතැම් අවස්ථාවලදී ස්වභාවික හේතු නිසා හෝ දැන හෝ නොදැන සිදුවන මානව ක්‍රියාකාරකම් ද මේ කෙරෙහි විශාල බලපෑමක් සිදු කරයි. ඇතැම් පිරිස් ප්‍රදේශීය මායිම් පෙන්වීම සඳහා යොදා ගන්නා විවිධ රූප සටහන් හා සඳකඩපහණ, මුරගල්, ගල්කණු, හෝ පුරාවස්තු ඇති ස්ථානවල වටිනා දේ තැන්පත් කර ඇතැයි යන වැරදි වැටහීම මත ද පැරණි උරුමයන් විනාශ කිරීම සිදු වේ. අනාගත පරපුර වෙනුවෙන් එම වටිනා උරුමය ආරක්ෂා කිරීම සියලුම දෙනාගේ යුතුකමකි.

**ඇගයීම අංක 3**

**පෙළපොත ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන මොනවා ද?

02. පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වීම සඳහා යොදා ගත් රූප සටහන් මොනවාද?

03. ඓතිහාසික ස්ථාන හා පුරා වස්තු විනාශ වීම කෙරෙහි බලපාන හේතු මොනවාද?